## සංක්ෂිප්තය

1998 ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය වෙනුවට වර්තමානයේ ශිෂ්‍ය කෙන්ද්‍රීය අධ්‍යාපනයට වැඩි අවධානයක් යොමු කර ඇත. මේ සඳහා පාසල් පාදක ඇගයීම් තුලින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ලබා දීමට උත්සාහ ගෙන තිබේ. එනමුත් අධ්‍යාපන පද්ධතිය තුල මේ පිළිබඳව නිසි අවබෝධයක් නොමැතිව අධ්‍යාපන කාර්යයේ නිරතවන ශිෂ්‍යයින් සේම ගුරුවරුන් ද සිටින බව පෙනේ. මෙම ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රම නිසා ශිෂ්‍යයා ශාස්ත්‍රීය ඥානය ලබන්නෙක් පමණක් නොව ආවේදනික විශේෂයෙන්ම මනෝචාලක හසුරුවන්නෙක් බවට පත් කිරීමට උත්සාහ ගෙන තිබෙන බව පෙනේ.

ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය වඩාත් සාර්ථකව යොදාගත හැකි ප්‍රායෝගික විෂයයක් වන්නේ සමාජ අධ්‍යයනයයි. එමනිසා සමාජ අධ්‍යයනය ඉගැන්වීම සඳහා ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රම භාවිත කිරීම තුලින් වඩා ඉහළ සාධන මට්ටමක් ළඟා කරගත හැකිදැයි මෙම පර්යේෂණයෙන් විමර්ශනය කිරීමට යොමු විය.

පළමු පරිච්ඡේදයෙන් පර්යේෂණයට අදාල මාතෘකාව පිළිබඳ විග්‍රහයක යෙදුණි. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය අපරදිග හා පෙරදිග රටවල භාවිතා වූ ආකාරය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට යොමු විය. සමාජ අධ්‍යයනය විෂය ආරම්භය, සමාජ අධ්‍යයනය විෂය ශ්‍රී ලංකාවට හඳුන්වා දීම, සමාජ අධ්‍යයනයේ වැදගත්කම, අරමුණු හා ඉගැන්වීමේ ක්‍රම පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක් සිදු කිරීමට යොමු විය.

දෙවන පරිච්ඡේදයට දේශීය සහ විදේශීය පර්යේෂණ සාහිත්‍ය පිළිබඳ එකතුවක් ඇතුළත් කර ඇත. මෙම එකතුව පර්යේෂණයේ මාතෘකාවට සමාන පර්යේෂණ කෘතීන් පිළිබඳවය. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය පිළිබඳව විදේශීය මෙන්ම දේශීය පර්යේෂණ අනාවරණය කරගෙන ඇත.

තුන්වන පරිච්ඡේදයට ඇතුළත් වූ භාවිත කරන ලද පර්යේෂණ ක්‍රම පිළිවෙත වූයේ වගු ආශ්‍රිත ප්‍රතිශත විස්තරාත්මක ක්‍රමයයි. ශිෂ්‍ය කේන්ද්‍රීය භාවිතය නිසා යහපත් සාධන මට්ටමක් පිළිබඳව විමසා බැලීමට යොමු විය. ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම පිළිබඳ ගුරුවරුන්ගේ ආකල්ප විමසීමට යොමු විය. සමාජ අධ්‍යයනය ඉගැන්වීමේදී ශිෂ්‍ය

කේන්ද්‍රීය ක්‍රම භාවිත කළ හැකි වඩාත් සාර්ථක ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ සොයා බැලීමට යොමු විය. ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමය සමාජ අධ්‍යයනය ඉගැන්වීම සඳහා භාවිත කිරීමේදී ඇතිවිය හැකි ගැටලු විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමට යොමු විය. දත්ත රැස්කිරීමට යොදාගත් පර්යේෂණ උපකරණ (ශිෂ්‍ය, ගුරු, දෙමාපිය) ප්‍රශ්නාවලි, (ශිෂ්‍ය,, විදුහල්පති) සම්මුඛ සාකච්ඡා ආශ්‍රිතව විමසන ලදි. කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් පෞද්ගලික පාසල් 10 ක 10 වන ශ්‍රේණියේ පන්ති කාමර 10 ක් පරීක්ෂකයාගේ සෘජු නිරීක්ෂණයට යොමුකර ගැනීමට හැකි විය. පර්යේෂණය සඳහා යොදාගු ලැබූ ශිෂ්‍ය ජනගහනය හා නියැදිය පෞද්ගලික පාසල් 10 කින් එක් පාසලකින් 30 බැගින් ශිෂ්‍යයින් 300 ක් තෝරා ගන්නා ලදි. එම ශිෂ්‍යයින්ගේ දෙමාපියන් 5 බැගින් පාසල් 10 න් දෙමාපියෝ 50 ක් අහඹු ලෙස නියැදියට හසු කර ගන්නා ලදි. එම පාසල්වල විදුහල්පතිවරු 10 දෙනා ද එක් පන්තියකින් ශිෂ්‍යයින් දෙදෙනා බැගින් ශිෂ්‍යයින් 20 ක් ද සම්මුඛ සාකච්ඡාවට යොමු කර ගන්නා ලදි.

හතරවන පරිච්ඡේදයෙන් කියවෙන්නේ විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිත කරමින් පර්යේෂණ මාතෘකාවට අදාලව කරන ලද දත්ත විශ්ලේෂණයයි.

පස්වන පරිච්ඡේදයේ ඇතුළත් කර ඇත්තේ විශ්ලේෂණයෙන් ලබාගත් නිගමන හා ඊට අදාල යෝජනාය. සමාජ අධ්‍යයනය කරුණු වඩාත් හොඳින් මතකයේ රැඳීමට ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රම උපකාරි වන බව අනාවරණය විය. ශිෂ්‍යයින් ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය ලැබීමට ප්‍රිය කරන බව ද විවිධ වූ ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රම සමාජ අධ්‍යයනය ඉගෙනීම සඳහා භාවිත කළ හැකි බව ද අනාවරණය විය. ගැටලු අවම කර ගනිමින් ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රමය ඉගෙනුම සඳහා යොදා ගැනීම වඩා ඉහළ සාධන මට්ටමක් ළඟාකරගත හැකි බව අනාවරණය විය. ගුරුවරු සම්ප්‍රදායෙන් බැහැරව නවීන ක්‍රම අනුගමනය කළ යුතුව ඇත. ප්‍රජානන, අවේදනික, මනෝචාලක යන ත්‍රිත්ව අංශ වර්ධනයට ශිෂ්‍ය කේන්ද්‍රීය ක්‍රම ආධාර වන බව ඔප්පු විය. ගුරුවරුන්ගේ වැටුප් වර්ධක ප්‍රායෝගික පරීක්ෂණ පවත්වා ලබාගන්නා විවිධ ශ්‍රේණි අනුව ලබා දීම වඩා යෝග්‍ය වේ.